# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2025.11.28 |

## 2025 ඔක්තෝබර් මාසයේ දී ඉදිකිරීම් කටයුතු තවදුරටත් වර්ධනය විය.

**ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, 2025 ඔක්තෝබර් මාසයේ දී දර්ශකාංක 64.3ක අගයක් වාර්තා කළේය.** පසුගිය මාසයේ දී වාර්තා වූ ඉහළම අගයට පසුව වාර්තා වූ මෙම ඉහළ අගය මගින් ඉදිකිරීම් කටයුතුවල තිරසාර ධනාත්මක දැක්මක් පෙන්නුම් කරයි.

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)
**64.3**
2025 ඔක්තෝබර්

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් බොහෝ දෙනෙකු විසින් රාජ්‍ය අංශයේ නව ව්‍යාපෘතිවල වැඩිවීමක් වාර්තා කිරීමත් සමග ඔක්තෝබර් මාසයේදී නව ඇණවුම් දර්ශකය තවදුරටත් වර්ධනය විය. ඉදිකිරීම් ව්‍යාපෘති අඛණ්ඩව ඉහළ යාමෙන් ඉදිකිරීම් ආයතනවල විශ්වාසය තවදුරටත් ඉහළ නැංවීම පිළිබිඹු කරමින්, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් දර්ශක මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළ දී තවදුරටත් ඉහළ ගියේය.

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **67.6** | **64.3** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 68.9 | 67.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.4 | 52.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 56.8 | 58.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 52.7 | 52.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බොහෝ ඉදිකිරීම් ආයතන අඛණ්ඩ ව්‍යාපෘති ලැබීමක් අපේක්ෂා කරන බැවින් ඉදිකිරීම් අංශයේ ඉදිරි මාස තුන සඳහා වන අපේක්ෂාවන් ධනාත්මකව පවතී.

### ගෝලීය ප්‍රවණතා

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| අයර්ලන්තය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ඉතාලිය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2025 නොවැම්බර් 28 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන
තොග මිලදී ගැනුම් : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය
අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.